www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: ශ්‍රේෂ්ඨාධිකරනය ෆොන්සේකා නිදහස් කිරීම ප්‍රතික්ෂේප කරයි

## Sri Lanka: Supreme Court refuses to release Fonseka

කේ රත්නායක විසිනි
2010 පෙබරවාරි 24

පරාජිත විපක්ෂ ජනාධිපතී අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා නිදහස් කරමින් අතුරු නියෝගයක් නිකුත් කරන ලෙසට කරන ලද ඉල්ලීම ශ්‍රේෂ්ඨාධිකරනය විසින් ඊයේ ප්‍රතික්ෂේප කරන ලදී. ඔහු පෙබරවාරි 08 දින සිට මිලිටරි පොලිසිය විසින් රඳවාගෙන සිටියි. විනිසුරු මඬුල්ල රැස්වූයේ, අත්අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූල භාවය අභියෝගයට ලක් කරමින් ෆොන්සේකාගේ බිරිඳ වන අනෝමා විසින් ගොනුකර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සමක් සලකා බැලීම සඳහාය.

අධිකරන තීන්දුවෙහි වැදගත් දේශපාලන බලපෑමක් අන්තර්ගතවී තිබේ. ජනවාරි 26 දින පැවති ජනාධිපතිවරනයෙන් ෆොන්සේකා ජනාධිපති මහින්ද රාජපක්ෂට පරාජයවූ අතර, අප්‍රේල් 08 දින පැවැත්වීමට නියමිත මහ මැතිවරනට ඉදිරිපත් වීමට සූදානම් වෙමින් සිටියි. ඊලඟ පෙත්සම් විභාගය අප්‍රේල් 26 දින තෙක් කල්තබා ඇති තත්වය හමුවේ, මැතිවරන ව්‍යාපාරයට ඔහුගේ ක්‍රියාකාරී සහභාගිත්වය ඇනහිට තිබේ.

පෙබරවාරි 12 දින පැවති මූලික විභාගයේදී පෙත්සම විභාගයට ගැනීමට තීන්දු කරන ලදී. අග්‍ර විනිශ්චයකාර අසෝක ද සිල්වාගේ ප්‍රධානත්වයෙන් රැස්වූ තිදෙනෙකුගෙන් සැදුම් ලත් විනිසුරු මඬුල්ල, නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥයන් ගෙන ආ විරෝධතා ඉවත දැමීය. ඊයේ පැවති විභාගය, පෙබරවාරි 21 දින වැඩ බලන අග්‍ර විනිශ්චය කාරිනිය ලෙස දිව්රැම් දුන් ශිරානි බන්ඩාරනායකගේ ප්‍රධානත්වයෙන් යුත් වෙනත් ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ලක් හමුවේ පැවැත්වුනි. රජය සතු ඩේලි නිව්ස් පුවත් පතට අනුව ද සිල්වා, විදේශ සංචාරයක යෙදී සිටියි.

ඊයේ නඩු විභාගය ආතති සහගත වූ බවක් පෙනී ගියේය. ෆොන්සේකාගේ නීතිඥ ෂිබ්ලි අසීස් පැමිනිලි කලේ, පෙත්සමේ විරෝධතා පිටපත් නීතිපතිගෙන් තමන් වෙත ලැබුනේ පෙර දිනයේදී නිසා උත්තර බැඳීමට කාලය අවශ්‍ය බවටයි. දිව්රැම් පෙත්සම් සලකා බැලීම සඳහා ඔහුට විනාඩි 10 ක කාලයක් ලබාදුන් නමුත්, අධිකරනය අවධාරනය කලේ, විනිශ්චය, අතුරු සහනයක් සැලසීමට සීමාවන අතර, පිලිතුරු බාරගැනීමක් සිදු නොවන බවකි.

පලමු දිනයේදී නීතිපති වෙනුවෙන් පෙනී සිටියේ සාපේක්ෂව බනිෂ්ඨ නිලධාරීන්ය. කෙසේ වෙතත් ඊයේ පැවති නඩු වාරය සඳහා නීතිපති මොහාන් පීරිස් ප්‍රථම වගඋත්තරකාර හමුදාපති ජගත් ජයසේකර වෙනුවෙන් තෙමේම පෙනී සිටියේය. අනෙකුත් වග උත්තරකරුවන් වූයේ, ජනාධිපතිගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඇතුලු ඉහල පෙලේ හමුදා නිලධාරීන් පිරිසකි.

විශ්‍රාමික හමුදා නිලධාරියෙකු වශයෙන් ෆොන්සේකා හමුදා නීතිය යටතේ අත්අඩංගුවට ගත නොහැකි බව කියා සිටිමින් අසීස්, ඔහු රඳවාගෙන සිටීම නීති විරෝධී යයි තර්ක කලේය. ෆොන්සේකා අත්අඩංගුවට ගෙන දෙසතියකටත් වැඩි කාලයක් ගතව ඇතත් කිසිදු චෝදනාවක් ගොනුකර නැති බව ඔහු පෙන්වා දුන්නේය. අවසන් අධිකරන නියෝගය ලැබෙන තෙක් අතුරු සහනයක් සඳහා ඔහුගේ අභියාචනය පිලිබඳව අසීස් යලි යලිත් කරුනු දැක්වීය. කොන්දේසි ඇතිව හෝ නැතිව ෆොන්සේකා නිදහස් කල යුතු බවත්, ඔහුගේ ආරක්ෂාව හා පැවැත්ම සහතික කල යුතු බවත්, ඔහුගේ නීතිඥයන්ට හා පවුලේ සාමාජිකයන්ට ඔහු හමුවීමට අවස්ථාව සැලසිය යුතු බවත් ඒ අතර විය.

අවසන් තීන්දුව ලබාදෙන තෙක් කිසිසේත්ම ඔහු නිදහස් කිරීමට නීතිපති විරුද්ධත්වය පල කල අතර, චෝදනා පිලිබඳ කාරනය ඔහු මඟහැරියේය. ඔහු කියා සිටියේ, "සාක්ෂි වල සාරාංශයක්" වාර්තාගතකර ඇති අතර, සති තුනක පමන කාලයක් තුල එය අවසන් කරන බවයි. ඉන් පසුව හමුදාපති චෝදනා සමඟ හමුදා අධිකරනය තවදුරටත් ඉදිරියට ගෙනයනවාද යන්න තීරනය කරනු ඇත.

අත්අඩංගුවට ගැනීමෙන් අඩුම තරමින් මාසයක් ගතවනතෙක් හෝ චෝදනා ගොනු නොකරනු ඇති නමුත්, අධිකරනය නීතිපතිගේ තර්කය පිලිගත්තේය. ඒ

අතර, ආන්ඩුවේ ප්‍රකාශකයන් හා රජය සතු මාධ්‍ය, ආන්ඩුව පෙරළීමට හා රාජපක්ෂ සොහොයුරන් ඝාතනය කිරීමට කුමන්ත්‍රනය කිරීම පිලිබඳ චෝදනා අලුත් කරමින් ෆොන්සේකාගේ නම කෙලෙසීම දිගටම කරගෙන ගියහ. ඔහුගේ සේවාදායකයා හමුදාවේ නීතිමය ක්‍රියාපටිපාටිය ප්‍රතික්ෂේප කල බවත්, එය ව්‍යාජ නඩු විභාගයක් සේ සලකන බවත් අසීස් සඳහන් කලේය.

නීතිපති පිරිස්, සුලු සහන කිහිපයකට එකඟ විය. ෆොන්සේකාගේ වෛද්‍ය වරයාට, ඔහුගේ නීතිඥයින්ට හා පවුලේ කිට්ටු සාමාජිකයන්ට ඔහු හමුවීමට ඉඩ සලසන බවට නීතිපති සහතික විය. නීතිඥවරුන් සම්බන්ධ ප්‍රශ්නයේදී ඔවුන් නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගත යුතුය. අප්‍රේල් 08 දින මහ මැතිවරනයට තරඟ කිරීමේ නාම යෝජනා පත්‍ර වලට ෆොන්සේකාගේ අත්සන ගැනීම සඳහා නීතිඥයන්ට ඔහු හමුවීමට ඉඩ සලසන බවට ද පිරිස් එකඟ විය. ෆොන්සේකා, අලුතෙන් පිහිටුවා ගන්නා ලද ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය නම් සභාගය යටතේ මැතිවරනයට ඉදිරිපත්වනු ඇත.

මෙම නඩුවේ දේශපාලන වැදගත්කම සනටුහන් කරමින්, ඊයේ පැවති නඩු වාරයට යුක්තිය පිලිබඳ ජාත්‍යන්තර කොමිසමේ (අයිසීජේ) නියෝජිතයෙක් ලෙස ඕස්ට්‍රේලියානු නීතිඥ වරයෙකු වන බිලී පර්විස් සහභාගී විය. ඔහු මාධ්‍ය වෙත මෙසේ පැවසීය. ''මේ කාරනය පිලිබඳව අයිසීජේ උනන්දුවක් දක්වනවා වගේම එම කටයුතු නිදහස් හා සාධාරන පරිදි සිදුවන්නේ ද යන වග නිරීක්ෂනය කිරීමට ද අවශ්‍යයි.''

දකුනු හා මධ්‍යම ආසියාව පිලිබඳ එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් රොබට් බ්ලේක් මේ සතියේ බීබීසී වෙත පැවසුවේ වොෂින්ටනය, රාජපක්ෂ ආන්ඩුව ෆොන්සේකා සිරභාරයට ගැනීමේ ක්‍රියාවලිය ගෙනයන ආකාරය ගැන සතුටට පත්වී නැති බවයි. ''මේ තාක් දුරට සිදුව ඇත්තේ අපි අපේක්ෂා කලාට වඩා අඩු දෙයකි. එහෙත් නිසැකයෙන්ම අපි ඔහුට විරුද්ධ චෝදනා ඉක්මනින් ගෙන ඒමට ආන්ඩුව දිරිගන්වන්නෙමු.''

ආන්ඩුව හා විපක්ෂය අතර තියුනු කාකොටාගැනීම්, මහ බලවතුන් අතර එදිරිවාදිකම් සමඟ බැඳී ඇති ආකාරය බ්ලේක්ගේ ප්‍රකාශයන්ගෙන් එලිමහනට ගෙන එයි. එල්ටීටීඊ යට එරෙහිව තමන් යලි ඇරඹූ යුද්ධය තුලින් රාජපක්ෂ චීනය වෙතට ඕනෑවට වඩා තල්ලුවී ඇතැයි ඔබාමා පරිපාලනය කනස්සල්ලට පත්ව සිටියි. බීජිනය ශ්‍රී ලංකාවට අයුධ, මූල්‍යාධාර හා රාජ්‍ය තාන්ත්‍රික සහයෝගය ලබාදුන් අතර එයට හිලව් වශයෙන් ආර්ථික හා මූලොපායික සහන හිමිකර ගත්තේය.

අත්අඩංගුවට ගැනීම පිලිබඳව වොෂින්ටනය ප්‍රවේශම් සහගත ලෙස සිය නොසතුට පලකරන්නේ, ඔවුන් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ගැන උනන්දුවක් දක්වන නිසා නොව, එම ප්‍රශ්නය රාජපක්ෂ මත පීඩනය යෙදීමටත්, චීනයේ කකුලෙන් ඇදීමටත් හොඳ මාධ්‍යයක් ලෙස සලකන බැවින්ය. එසේම ඔවුන්, එක්සත් ජනපද අවශ්‍යතාවන්ට ෆොන්සේකා වඩාත් නම්මා ගත හැකි අයෙක් ලෙස ද දැකගනියි. සිය මැතිවරන ව්‍යාපාරයේදී ෆොන්සේකා, ලංකාව කෙරෙහි ''ජාත්‍යන්තර ප්‍රජාවේ'' විශ්වාසය පලුදු කරගත් බවට රාජපක්ෂ විවේචනයට ලක් කලේය. කොලඹ දේශපාලන සංස්ථාපිතය තුල සිදුවන කර්කෂ කන්ඩායම්ක කුලල් කා ගැනීම් නිසා අධිකරනය, මිලිටරිය හා පොලිසිය ඇතුලු රාජ්‍ය යාන්ත්‍රනය එන්ට එන්ටම දේශපාලනීකරනයට ලක්වෙමින් තිබේ. ජනාධිපතිවරනයෙන් පසුව ආරක්ෂක හමුදා, විශ්‍රාමික හමුදා නිලධාරීන් ද ඇතුලු ෆොන්සේකා අනුගාමිකයන් ගනනාවක්ම අත්අඩංගුවට ගෙන තිබේ. ජෙනරාල්ගේ හිතවතුන් ලෙස සලකන ලද මිලිටරියේ හා පොලිසියේ ඉහල නිලතල දැරූ පුද්ගලයින් මාරුකර හැරීමෙන් හෝ විශ්‍රාම ගැන්වීමෙන් ආන්ඩුව විරේක කිරීමක් ද සිදුකොට තිබේ.

අප්‍රේල් 08 දින පාර්ලිමේන්තු මැතිවරනය අවසන් වන තෙක් ෆොන්සේකා සිරගත කොට තැබීම සඳහා රාජපක්ෂ පෙන්වන අධිෂ්ඨානය, බලය සම්බන්ධ ඔහුගේ ග්‍රහනය කොතෙක් දුබල ද යන්න පිලිබඳ ඇඟවුමකි. පාලක හවුල කියා ඇත්තේ, ව්‍යවස්ථාව වෙනස්කිරීම සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් ලබාගැනීම සිය ඉලක්කය වී ඇති බවයි. විධායක ජනාධිපති වශයෙන් රාජපක්ෂට පුලුල් බලතල හිමිවීමේ කාරනය තිබියදීම, දැනටමත් ඔහු හොබවන ආඥාදායක පාලනය තහවුරු කර ගැනීම ඔහුගේ බලාපොරොත්තුවයි.

ආන්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමෝපායන්ගේ ප්‍රධාන ඉලක්කය, ආන්ඩුව සමඟ කිසිදු මූලික වෙනසක් නැති විරුද්ධ පක්ෂ නොව, කම්කරු පන්තියයි. පසුගිය මැයි මාසයේ එල්ටීටීඊ ලත් පරාජයත් සමඟ අවසන්වූ යුද්ධය, ආන්ඩුව දැවැන්ත නය කන්දරාවක ගිල්වා දැමීය. මූල්‍ය අර්බුදයක් මඟහරවා ගැනීම්වස් රාජපක්ෂට, පසුගිය වසරේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් බිලියන 2.6 ක නයක් ගැනීමට බල කෙරින.

මැතිවරනය අවසන්වූ වහාම ජාමූඅ සීමාපැනවීමේ පියවර ක්‍රියාත්මක කිරීමට ආන්ඩුවට බලකෙරෙන තතු තුල පොදු වියදම් හා වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් දරුනු ලෙස කපා හැරෙනු ඇත. නොවරදවාම පැන නැගෙනු ඇති මහජන විරෝධය බිඳ දැමීම සඳහා සූදානම්වීම්වස් රාජපක්ෂ, විපක්ෂය දුබල කොට තමන්ගේ තත්වය ශක්තිමත්කර ගැනීමට උත්සුකව සිටියි.


© www.wsws.org